# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,880 — 1969 නොවැම්බර් 14 වැනි සිකුරාද — 1969.11.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... ... | 239 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන — | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | – | විවිධ දැන්වීම් — — | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන — ... | — | | |



## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් වතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරි දිනකම දහයේ සිට හතර දක්වා ද, සෑම වරුවේ දිනවල දහයේ සිට එක දක්වා ද ලේඛණ පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල සවස 3 දක්වා ද, වරුවේ දිනවල දවල් 12 දක්වා ද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියා පදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක් සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම්

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ " ඒ " කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කායාිලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ " බී " කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කායාිලයීය අංකයට මුලින් " බී " අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුඬවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමඟ ටී. ඇම්. 7 දරණ පෝර්ම මගින් විරෝධතා දන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම්කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1969**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජූනි | .. | 69. 6. 6 | සිකුරාද | ... | 69. 5.30 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.13 | සිකුරාද | ... | 69. 6. 6 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.20 | සිකුරාද | ... | 69. 6.13 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.27 | සිකුරාද | ... | 69. 6.20 | සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | ... | 69. 7. 4 | සිකුරාද | ... | 69. 6.27 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.11 | සිකුරාද | ... | 69. 7. 4 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.18 | සිකුරාද | ... | 69. 7.11 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.25 | සිකුරාද | ... | 69. 7.18 | සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | ... | 69. 8. 1 | සිකුරාද | ... | 69. 7.25 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8. 8 | සිකුරාද | ... | 69. 8. 1 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.15 | සිකුරාද | ... | 69. 8. 8 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.22 | සිකුරාද | ... | 69. 8.15 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.29 | සිකුරාද | ... | 69. 8.22 | සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 69. 9. 5 | සිකුරාද | ... | 69. 8.29 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 | සිකුරාද | ... | 69. 9. 5 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.19 | සිකුරාද | ... | 69. 9.12 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 | සිකුරාද | ... | 69. 9.19 | සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 | බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 | බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 | සිකුරාද | ... | 69.10. 9 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 | සිකුරාද | ... | 69.10.17 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 | සිකුරාද | ... | 69.10.24 | සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 | සිකුරාද | ... | 69.10.31 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 | සිකුරාද | ... | 69.11. 6 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 | සිකුරාද | .. | 69.11.14 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 | සිකුරාද | ... | 69.11.21 | සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... | 69.12. 5 | සිකුරාද | ... | 69.11.28 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 | සිකුරාද | ... | 69.12. 4 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 | සිකුරාද | ... | 69.12.12 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 | සිකුරාද | ... | 69.12.18 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1969 ජූනි මස 13 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.**

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.